සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

95137

இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2003

ආර්ථික විද්‍යාව I (I කොටස)
பொருளியல் I (பகுதி I)
Economics I (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය :.....

සැලකිය යුතුයි.

* මෙම කොටසේ ප්‍රශ්න 20 ක් ඇත. ඒ සියලු ප්‍රශ්න අනිවාර්ය වේ.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක් ලැබෙන අතර, මුළු කොටසම ලකුණු 40 ක් හිමි වේ.
* එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි.
  එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුයි.
* නියමිත කාලය අවසන් වූ විට I හා II කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතුයි.

---

1. රෙදි සහ සහල් යන භාණ්ඩ දෙක සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහත දක්වේ.



මෙම ආර්ථිකය තම නිෂ්පාදන සංයෝගය A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා වෙනස් කරන්නේ නම්, රෙදි සහ සහල් නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(i) සහල් නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය වැඩිවන අතර රෙදි නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය අඩු වේ.
(ii) සහල් නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය අඩු වන අතර රෙදි නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය වැඩි වේ.
(iii) සහල් සහ රෙදි යන භාණ්ඩ දෙකෙහි ම ආවස්ථික පිරිවැය වැඩි වේ.
(iv) සහල් සහ රෙදි යන භාණ්ඩ දෙකෙහි ම ආවස්ථික පිරිවැය අඩු වේ.
(v) සහල් නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය වැඩිවන අතර රෙදි නිෂ්පාදනයෙහි ආවස්ථික පිරිවැය නොවෙනස් ව පවතී.

2. ආර්ථික භාණ්ඩයක් යනු කුමක් ද?

(i) ලාභයක් සහිත ව අලෙවිකරනු ලබන භාණ්ඩයකි.
(ii) වැඩිවන කාර්යක්ෂමතා තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයකි.
(iii) පෞද්ගලික අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩයකි.
(iv) ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයකි.
(v) රාජ්‍ය අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩයකි.

www.pastpaperlk.com
www.artsapi.lk

3. සැලසුම්ගත ආර්ථික ක්‍රමයක "කුමක් නිෂ්පාදනය කළ යුතු ද" යන ආර්ථික ප්‍රශ්නය තීරණය වන්නේ
(i) ව්‍යවසායකයින්ගේ ස්වාධීන තීරණ මගිනි.
(ii) පාරිභෝගිකයන් සහ රජය ඒකාබද්ධව ගනු ලබන තීරණ මගිනි.
(iii) වෙළෙඳ පොළ සහ රජය යන අංශ දෙකේ ම මැදිහත් වීමෙනි.
(iv) රජය විසින් දෙනු ලබන නියෝග මගිනි.
(v) පාරිභෝගිකයින්ගේ වියදම් තීරණ මගිනි.

4. සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන් විය හැක්කේ
(i) පාරිභෝගිකයින්ගේ ආදායම වැඩිවීමක දී ය.
(ii) සලකා බලන භාණ්ඩයේ මිල වැඩිවීමක දී ය.
(iii) අනුපූරක භාණ්ඩවල මිල වැඩිවීමක දී ය.
(iv) අනුපූරක භාණ්ඩ සඳහා කරනු ලබන ප්‍රචාරණ වියදම් වැඩිවීමක දී ය.
(v) භාණ්ඩයක් සඳහා ඇති වරණය වැඩිවීමක දී ය.

5. පොල් සඳහා වෙළෙඳ පොළ ඉල්ලුම් ශ්‍රිතය, $Qd = 300 - 6P$ ද, සැපයුම් ශ්‍රිතය $Qs = 20 + 8P$ ද, වේ යැයි සලකන්න. මෙම තත්ත්වය යටතේ පොල් ගෙඩියක මිල රුපියල් 15 ක් ලෙස නියම කරනු ලැබුවහොත් පොල් වෙළෙඳ පොළෙහි ඇති විය හැකි තත්ත්වය කුමක් ද?
(i) සමතුලිතයක් ඇතිවීම.
(ii) අධි ඉල්ලුම නිසා මිල ඉහළ යෑම.
(iii) අධි ඉල්ලුම නිසා මිල පහළ යෑම.
(iv) අධි සැපයුම නිසා මිල ඉහළ යෑම.
(v) අධි සැපයුම නිසා මිල පහළ යෑම.

6. X භාණ්ඩයෙහි මිල රුපියල් 50 සිට රුපියල් 30 දක්වා අඩුවීම නිසා Y භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ඒකක 1000 ක සිට ඒකක 1200 ක් දක්වා වැඩිවේ. X සහ Y භාණ්ඩ අතර ඉල්ලුමේ හරස් නම්‍යතාවය කොපමණ ද?
(i) 0·5
(ii) – 0·5
(iii) 2·0
(iv) – 2·0
(v) 2·5

7. පහත දැක්වෙන රූප සටහන කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳ පොළ සමතුලිතය නිරූපණය කරයි.

මෙම භාණ්ඩය සඳහා නිෂ්පාදන සහනාධාරයක් දීමට රජය තීරණය කරනු ලැබුවහොත් එමගින් වාසි ලබන්නේ
(i) පාරිභෝගිකයන් පමණි.
(ii) නිෂ්පාදකයන් පමණි.
(iii) පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් එක සමාන ලෙස ය.
(iv) නිෂ්පාදකයන්ට වඩා පාරිභෝගිකයන් ය.
(v) පාරිභෝගිකයන්ට වඩා නිෂ්පාදකයන් ය.

[තුන්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

8. කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය මත විශේෂිත වූ බද්දක් රජය පනවනු ලැබුවහොත්, වෙළෙඳ පොළ සැපයුම් වක්‍රය SS සිට S_1S_1 දක්වා විතැන්වන බව පහත සඳහන් රූප සටහනෙන් දක්වේ.



මෙහි දී පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් විසින් දරනු ලබන බදු බර වෙන් වෙන් වශයෙන් කොපමණ වේ ද?

(i) පාරිභෝගිකයන් රුපියල් 1200 ක් ද නිෂ්පාදකයන් රුපියල් 400 ක් ද වේ.
(ii) පාරිභෝගිකයන් රුපියල් 800 ක් ද නිෂ්පාදකයන් රුපියල් 1200 ක් ද වේ.
(iii) පාරිභෝගිකයන් රුපියල් 400 ක් ද නිෂ්පාදකයන් රුපියල් 1200 ක් ද වේ.
(iv) පාරිභෝගිකයන් රුපියල් 800 ක් ද නිෂ්පාදකයන් රුපියල් 400 ක් ද වේ.
(v) පාරිභෝගිකයන් රුපියල් 400 ක් ද නිෂ්පාදකයන් රුපියල් 800 ක් ද වේ.

9. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම මිල අනම්‍යතාවෙන් යුක්තවේ නම්, මුළු අයභාරය

(i) මිල වැඩිවන විට අඩුවේ.
(ii) මිල කුමන දිශාවට වෙනස් වුව ද වැඩිවේ.
(iii) මිල අඩුවන විට වැඩිවේ.
(iv) මිල කුමන දිශාවට වෙනස් වුව ද නොවෙනස්ව පවතී.
(v) මිල වැඩිවන විට වැඩිවේ.

10. නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය දෙගුණ වුවහොත්, එහි ආන්තික පිරිවැය

(i) දෙගුණ වනු ඇත.
(ii) දෙගුණයකට වඩා වැඩිවනු ඇත.
(iii) ස්ථාවරව පවතිනු ඇත.
(iv) සියයට 50 කින් වැඩිවනු ඇත.
(v) සියයට 100 කින් අඩුවනු ඇත.

11. ප්‍රාමාණික ලාභය ලෙස හඳුන්වන්නේ

(i) වර්ෂ කිහිපයක් මුළුල්ලේ නිෂ්පාදන ආයතනයක් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයයි.
(ii) වර්ෂ කිහිපයක් මුළුල්ලේ කර්මාන්තයක් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයයි.
(iii) නිෂ්පාදන සම්පත් පවත්නා භාවිතයෙහි රඳවා තබාගැනීම සඳහා අවශ්‍ය වන ලාභ ප්‍රමාණයයි.
(iv) නිෂ්පාදන ආයතනය සමතුලිත තත්ත්වයෙහි තබා ගැනීම සඳහා අවශ්‍ය වන ලාභ ප්‍රමාණය යි.
(v) ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට සමාන වන අවස්ථාවේ දී නිෂ්පාදනය කිරීමෙන් උපයනා ලාභ ප්‍රමාණයයි.

12. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් උපරිම ලාභ ලබනුයේ

(i) මිල ආන්තික පිරිවැයට සමානවන සහ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවේ දී ය.
(ii) මිල ආන්තික පිරිවැයට සමානවන සහ මිල අවම සාමාන්‍ය ස්ථාවර පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවේ දී ය.
(iii) මුළු අයභාරය උපරිම වන අවස්ථාවේ දී ය.
(iv) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම වන අවස්ථාවේ දී ය.
(v) සාමාන්‍ය මුළු පිරිවැය අවම වන අවස්ථාවේ දී ය.

13. පූර්ණ තරඟකාරී කර්මාන්තයක ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?

(i) කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය පහළට බැවුම් වීම.
(ii) ඒ ඒ ආයතනයේ ඉල්ලුම් වක්‍ර පූර්ණ නම්‍ය වීම.
(iii) ඒ ඒ ආයතනය විසින් තම නිමැවුම් ප්‍රමාණය තීරණය කිරීම.
(iv) සුළු වශයෙන් ප්‍රභේදනය වූ භාණ්ඩ තිබීම.
(v) කර්මාන්තයේ මුළු සැපයුමෙන් කුඩා ප්‍රතිශතයක් පමණක් සපයන ආයතන රාශියක් තිබීම.

www.pastpaperlk.com
www.afsapi.lk

14. ඒකාධිකාරී තරඟය සහිත වෙළඳ පොළක නිෂ්පාදන ආයතනයක්, දිගුකාලයේ දී
(i) පූර්ණ තම්‍ය ඉල්ලුම් වක්‍රයට මුහුණ දෙයි.
(ii) සාමාන්‍ය මුළු පිරිවැය අවම වන නිමැවුමට වඩා වැඩි නිමැවුමක් නිෂ්පාදනය කරයි.
(iii) සාමාන්‍ය මුළු පිරිවැය අවම වන නිමැවුමකට වඩා අඩු නිමැවුමක් නිෂ්පාදනය කරයි.
(iv) සාමාන්‍ය මුළු පිරිවැය අවම කෙරෙන නිමැවුමක් නිෂ්පාදනය කරයි.
(v) අති ප්‍රමාණික ලාභ උපයයි.

15. වෙළෙඳ පොළ අසාර්ථක වීමට බලපාන හේතුවක් **නොවන්නේ** කුමක් ද?
(i) පොදු භාණ්ඩ තිබීම.
(ii) බාහිර පිරිවැය පැවතීම.
(iii) බාහිර ප්‍රතිලාභ පැවතීම.
(iv) පාරිභෝගික ස්වාධිපත්‍යයක් තිබීම.
(v) ඒකාධිකාරී කර්මාන්ත තිබීම.

16. අතිරේක පුද්ගලයෙකු සඳහා ශුද්ධ පොදු භාණ්ඩයක් සැපයීමේ දී සමාජ ආන්තික පිරිවැය
(i) සෘණ අගයක් ගනී.
(ii) ශූන්‍ය වේ.
(iii) ධන අගයක් ගනී.
(iv) අනන්ත වේ.
(v) දෙගුණ වේ.

17. දෙන ලද වර්ෂයක දළ දේශීය නිෂ්පාදිතයට පහත සඳහන් ද අතුරෙන් කුමක් ඇතුළත් කෙරේ ද?
(i) ව්‍යාපාරික සමාගමක කොටස් 1000 ක් මිලට ගැනීම.
(ii) කොටස් ගනුදෙනුවේ දී තැරැව්කාර ආයතනයට 2% තැරැව් ගාස්තුවක් ගෙවීම.
(iii) රජයේ සේවකයකු මාසික විශ්‍රාම වැටුපක් ලැබීම.
(iv) විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු මාසික ව ශිෂ්‍යත්ව දීමනාවක් ලැබීම.
(v) රජය විසින් භාණ්ඩාගාර බිල් පත් සඳහා පොලිය ගෙවීම.

18. කිසියම් ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබට සපයා ඇතැයි සලකන්න.

අපනයන	= 300
ආනයන	= 400
බදු	= 1100
රාජ්‍ය වියදම්	= 1400
ඉතුරුම්	= 900

මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම කොපමණ වේ ද?
(i) 600
(ii) 700
(iii) 900
(iv) 1100
(v) 1300

19. රාජ්‍ය හා විදේශ වෙළෙඳම් අංශවලින් තොර සරල සාර්ව ආර්ථික ආකෘතියක ඉතුරුම් ශ්‍රිතය $S = -300 + 0{\cdot}1\,Y$ වේ. ආයෝජනය 200 කින් වැඩි වුවහොත් පරිභෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩි වේ ද?
(i) 180
(ii) 200
(iii) 1800
(iv) 2000
(v) 2100

20. "වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ගැටලුවක් වනුයේ ද. දේ. නි. ට සාපේක්ෂව රාජ්‍ය ආදයම පහළ මට්ටමක පැවතීම ය." 2001 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදයම, ද. දේ. නි. යෙන් කවර ප්‍රතිශතයක් ද?
(i) 19·0%
(ii) 17·7%
(iii) 18·5%
(iv) 16·0%
(v) 16·5%

**

www.pastpaperlk.com
www.artsapi.lk

[පිටපත් ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

95138

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2003

ආර්ථික විද්‍යාව I (II කොටස)
பொருளியல் I (பகுதி II)
Economics I (Part II)

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

"අ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද,
"ආ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

"අ" උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

1. (i) "හිහකම" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
"හිහකම" පවතින විට අවශ්‍යයෙන් ම තේරීම් කළ යුත්තේ ඇයි?
(ලකුණු 05 යි)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය "හිහකම" පෙන්නුම් කරන්නේ කෙසේ ද? ඔබේ පිළිතුර රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05 යි)

(iii) මූලයට අවතල වූ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින්, නිෂ්පාදන සම්පත්වල ස්වභාවය සහ ආවශ්‍යතික පිරිවැය පිළිබඳ ව කුමක් කියවේ ද?
(ලකුණු 05 යි)

2. (i) නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ කවරේ ද?
(ලකුණු 03 යි)

(ii) නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකයක මිල යන්ත්‍රණය මගින් සම්පත් බෙදහැරෙන ආකාරය සඳහන් කරන්න.
(ලකුණු 03 යි)

(iii) මිශ්‍ර ආර්ථික ක්‍රමයක ආදායම් විෂමතාව පිළිබඳ ප්‍රශ්න විසඳීමට රජයකට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දක්වන්න.
(ලකුණු 04 යි)

(iv) ආර්ථිකයක සම්පත් බෙදහැරීමේ මාධ්‍යයක් වශයෙන් මිල යන්ත්‍රණයෙහි දක්නට ලැබෙන ප්‍රධාන අවාසි කවරේ ද?
(ලකුණු 05 යි)

3. (i) ඉල්ලුමේ මිල නම්‍යතාව තීරණය කෙරෙන ප්‍රධාන සාධක කවරේ ද?
(ලකුණු 03 යි)

(ii) පහත සඳහන් එක් එක් නම්‍යතා තත්ත්වයනට අදළ භාණ්ඩ වර්ග මොනවා දැයි සඳහන් කරන්න.
(අ) මිල ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගන්නා භාණ්ඩ වර්ගය
(ආ) හරස් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා භාණ්ඩ වර්ගය
(ඇ) ආදායම් ඉල්ලුම් නම්‍යතාව 1 ට වැඩි අගයක් ගන්නා භාණ්ඩ වර්ගය

(iii) කිසියම් භාණ්ඩයක මිල අඩු වීම නිසා ඇතිවන ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද?
(ලකුණු 03 යි)
(ලකුණු 04 යි)

(iv) පහත සඳහන් අවස්ථාවල දී මුළු අයභාරය වැඩි වේ ද, අඩු වේ ද, නැතහොත් නොවෙනස් ව පවතී ද යන්න සඳහන් කරන්න.
(අ) අනම්‍ය ඉල්ලුමක දී මිල පහළ වැටීම.
(ආ) නම්‍ය ඉල්ලුමක දී මිල ඉහළ යෑම.
(ඇ) අනම්‍ය ඉල්ලුමක දී මිල ඉහළ යෑම.
(ඉ) නම්‍ය ඉල්ලුමක දී මිල පහළ වැටීම.
(ඊ) ඒකීය නම්‍ය ඉල්ලුමක දී මිල පහළ වැටීම.
(ලකුණු 05 යි)

4. (i) රූප සටහනක් ඇසුරෙන් "නිෂ්පාදක අතිරික්තය" පැහැදිලි කරන්න.
(ලකුණු 03 යි)

(ii) පූර්ණ තරහය සහ ඒකාධිකාරී තරහය යන වෙළෙඳ පොළ තත්ත්ව අතර දකිය හැකි සමානකම් **දෙකක්** සහ අසමානකම් **දෙකක්** දක්වන්න.
(ලකුණු 04 යි)

(iii) "හීනවන ඵල" සහ "අඩුවන පරිමාණකුල ඵල" අතර වෙනසක් ඇත්නම් එම වෙනස සඳහන් කරන්න.
(ලකුණු 04 යි)

(iv) කිසියම් නිෂ්පාදන සාධකයක සමස්ත ඉපයුම් සංක්‍රාම ඉපැයුම්වලින් පමණක් ම සමන්විත විය හැක්කේ කුමන අවස්ථාවක දී ද? රූප සටහනක් ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)

"ආ" උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරාගන්න.)

5. කුසියම් ආර්ථිකයක ජාතික ආදායම් හිඟුම් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

අයිතමය	වටිනාකම (රුපි. මිලියන)
පෞද්ගලික පරිභෝජන වියදම	45 000
රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම	15 000
දළ ආයෝජනය	20 000
තොග වෙනස් වීම	500
ශුද්ධ අපනයන	-5 000
ආනයන	16 000
විදේශ ශුද්ධ සාධක ආදායම්	-2 000
විදේශ ශුද්ධ සංක්‍රාම	5 000

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) දළ ජාතික නිෂ්පාදිතය *(ලකුණු 04 යි)*

(ii) වැය කළ හැකි දළ ජාතික නිෂ්පාදිතය *(ලකුණු 03 යි)*

(iii) ජාතික ඉතුරුම් *(ලකුණු 04 යි)*

(iv) ගෙවුම් ශේෂයේ චර්තන හිඟුමේ ශේෂය *(ලකුණු 04 යි)*

6. (i) "විවෘත ආර්ථිකයක ජාතික ආදායම් සමතුලිතය දෙආකාරයකට පෙන්නුම් කළ හැකි ය." සම්මත සංකේත ඇසුරෙන් එම ක්‍රම **දෙක** දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) පහත සඳහන් සමීකරණවලින් පිළිබිඹුවන සාර්ව ආර්ථිකයක් සැලකිල්ලට ගන්න.
(වටිනාකම් රුපියල් මිලියනවලිනි.)

$C = 200 + 0{\cdot}9\ Yd$

$I = 80$

$G = 300$

$T = 120$

C = පරිභෝජන වියදම; I = ආයෝජන වියදම; G = රජයේ වියදම; T = බදු

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. *(ලකුණු 05 යි)*

(ආ) ආයෝජනය රුපියල් මිලියන 20 කින් වැඩිවන්නේ නම් සමතුලිත ජාතික ආදායම් මට්ටමට කුමක් වේ ද? *(ලකුණු 04 යි)*

(ඇ) පූර්ණසේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම රුපියල් මිලියන 5000 ක් වේ නම්, එම මට්ටම ළඟා කර ගැනීම සඳහා ආයෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩි කළ යුතු ද? *(ලකුණු 04 යි)*

7. (i) රජයේ ප්‍රධාන ආර්ථික කාර්යයන් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) "ශුද්ධ පොදු හාණ්ඩයක්" යනු කුමක්ද? *(ලකුණු 03 යි)*

(iii) "රාජ්‍ය අයාර්ථක වීම (state failure)" යන්නෙන් කුමක් අදහස් වේ ද? *(ලකුණු 04 යි)*

(iv) "මෑත කාලයේ බොහෝ රටවල රාජ්‍ය අංශයේ කාර්යභාරය අඩුවී තිබේ." මෙම ප්‍රවණතාවයට බලපෑ සාධක සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(i) "මෑත කාලයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් අතිවිශාල ලෙස පාඩු ලබා ඇත." ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන්හි අකාර්යක්ෂමතාව කෙරෙහි බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) අයවැය ලේඛනයේ හිහයක් පියවීම සඳහා යොදා ගත හැකි ප්‍රසාරණාත්මක ක්‍රම **දෙකක්** සහ ප්‍රසාරණාත්මක නොවන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජිත වැදගත් ප්‍රතිසංස්කරණ **හතරක්** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iv) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක **දෙකක්** සහ විපක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

* * *

www.pastpaperlk.com
www.artsapi.lk